# තනතුරු පුරප්පාඩු

සීමාසහිත කුලියාපිටිය කොට්ඨාසයේ විවිධ සේවා සමුපකාර සමිතියේ පුරප්පාඩුව පවතින පහත තනතුර සඳහා සමිති අභ්‍යන්තරයෙන් හා බාහිරින් සමිති බල ප්‍රදේශය තුළ පදිංචි අයදුම්කරුවන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

## තනතුරු නාමය - නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී (බැංකු) III ශ්‍රේණිය

1. **වැටුප් පරිමාණය** - 3/2020 MEL = රු.35125 = 750 × 10 – 900 × 11 – 1000 × 05 =රු.57525/- (A ශ්‍රේණිය)
2. **වයස් සීමාව** - අභ්‍යන්තර අයදුම්කරුවන් සඳහා වයස් සීමාව බල නොපැවැත්වේ.
   - බාහිර අයදුම්කරුවන් සඳහා වයස් සීමාව අවුරුදු 45 ට නොවැඩි විය යුතුය.

**අධ්‍යාපන හා වෙනත් සුදුසුකම්**
**(බාහිර බඳවා ගැනීම් සඳහා)**

අ.) විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්වවිද්‍යාලයකින් වාණිජවේදි හෝ ව්‍යාපාර කළමනාකරණය හෝ ආර්ථික විද්‍යාව විෂයය සහිතව හෝ උපාධියක් ලබා තිබීම සමඟ පිළිගත් ආයතනයක විධායක මට්ටමේ තනතුරක වසර 02 කට නොඅඩු සතුටුදායක සේවා පළපුරුද්දක් ලබා තිබීම.

**හෝ**

ආ.) උසස් ජාතික ගණකාධිකරණ ඩිප්ලෝමාව (HNDA) සමත්වීම හෝ ශ්‍රී ලංකා වරලත් ගණකාධිකරණ ආයතනයේ (CA) ආවසරික සහතිකය (Executive Level) ලබා තිබීම හෝ සමඟ බැංකු ක්ෂේත්‍රයේ අධීක්ෂණ මට්ටමේ තනතුරක වසර 03 කට නොඅඩු සතුටුදායක සේවා පළපුරුද්දක් ලබා තිබීම.

**හෝ**

ඇ.) ශ්‍රී ලංකා බැංකු කරුවන්ගේ ආයතනයේ බැංකු හා මූල්‍ය ඩිප්ලෝමාව සමත්වීම සමඟ බැංකු ක්ෂේත්‍රයේ වසර 05 කට නොඅඩු අධීක්ෂණ මට්ටමේ තනතුරක සතුටුදායක සේවා පළපුරුද්දක් ලබා තිබීම.

**අධ්‍යාපන හා වෙනත් සුදුසුකම්**
**(අභ්‍යන්තර බඳවාගැනීම් සඳහා)**

අ.) විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්වවිද්‍යාලයකින් වාණිජවේ දී හෝ ව්‍යාපාර කළමනාකරණ හෝ ආර්ථික විද්‍යාව විෂයය සහිතව හෝ උපාධියක් ලබා තිබීම හෝ සමඟ රැකියා ක්ෂේත්‍රයට අදාළව සමුපකාර ව්‍යාපාරයේ වසරකට නොඅඩු අධීක්ෂණ මට්ටමේ තනතුරක සතුටුදායක සේවා පළපුරුද්දක් ලබා තිබීම.

**හෝ**

ආ.) උසස් ජාතික ගණකාධිකරණ ඩිප්ලෝමාව (HNDA) සමත් වීම හෝ ශ්‍රී ලංකා වරලත් ගණකාධිකරණ ආයතනයේ (CA) ආවසරික සහතිකය (Executive Level) ලබා තිබීම හෝ සමඟ TSL වැටුප් පරිමාණයේ තනතුරක වසර 02 කට හෝ SL වැටුප් පරිමාණයේ තනතුරක වසර 03 කට නොඅඩු සතුටුදායක සේවා පළපුරුද්දක් ලබා තිබීම.

**හෝ**

ඇ.) පිළිගත් ආයතනයකින් ලබා ගත් වසරකට නොඅඩු අධ්‍යයන කාලයක් සහිතව බැංකු කළමනාකරණය පිළිබඳව ඩිප්ලෝමාවක් සමත්වීම හෝ ශ්‍රී ලංකා බැංකු කරුවන්ගේ ආයතනයේ බැංකු හා මූල්‍ය ඩිප්ලෝමාව සමත් වීම හෝ සමඟ TSL වැටුප් පරිමාණයේ තනතුරක වසර 04 කට හෝ SL වැටුප් පරිමාණයේ තනතුරක වසර 08 කට නොඅඩු සතුටුදායක සේවා පළපුරුද්දක් තිබීම.

**වෙනත් දීමනා හා වරප්‍රසාද**

1. කාර්යමණ්ඩල දිරි දීමනා. වෙනත් දීමනා හිමි වේ.
2. සමුපකාර සේවක විශ්‍රාම වැටුප් දායක ක්‍රමයට බඳවා ගැනීම.
3. EPF / ETF අරමුදලේ දායකත්වය හිමිවේ.
4. සහණ පොලී පදනම මත සේවක ණය ලබා ගැනීමේ හැකියාව

ඉහත තනතුර සඳහා සමිති අභ්‍යන්තරයෙන් හා බාහිරින් සමිති බල ප්‍රදේශය තුළ පදිංචි අයදුම්කරුවන්ගෙන් අයදුම්පත් 2024.02.01 වන දින සිට 2024.02.21 වන දින දක්වා කැඳවනු ලැබේ. ඔබ විසින් පිළියෙල කර ගන්නා ලද අයදුම්පතක් එවිය යුතු අතර, අධ්‍යාපන සහතික ඡායා පිටපත්, උප්පැන්න සහතිකයේ ඡායා පිටපත, ග්‍රාම සේවා සහතිකයේ ඡායා පිටපත, සේවා සහතිකයේ පිටපත් මේ සමඟ අමුණා එවිය යුතු වේ. ඔබගේ අයදුම්පත්‍ර 2024.02.21 දින මධ්‍යහ්න 12.00 ට පෙර සභාපති, සීමා සහිත කුලියාපිටිය කොට්ඨාසයේ විවිධ සේවා සමුපකාර සමිතිය, කුලියාපිටිය යන ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් හෝ ගෙනවිත් භාර දීම සිදු කළ හැකිය.

**සභාපති**
**ඩී.එම්.ඒ.කේ. දිසානායක.**

**දුරකථන - 037 - 2281163 / 037 - 4942452**
**2024.01.30**